ශිල්ප යාත්‍රා

කටුගස්තොට අධ්‍යාපන කලාපය

5 ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

1 පත්‍රය

අංක 1

කාලය. පැය 1යි

සැකසුම: මප/ කටු/ කොණ්ඩදෙණිය කනිෂ්ඨ විද්‍යාලය

නම.....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:


- ඔබේ **නම** ඉහත දැක්වෙන **තින් ඉරි මත** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම **පිළිතුරු 3 බැගින් ඇත.** ඒවා අතුරෙන් එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර** තෝරා යටින් ඉරක් අඳින්න.


පිටු අංක	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීමකළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය.	V/II/S/CH


- **පළමු රූපයට සමාන නොවන රූපය තෝරා යටින් ඉරක් අඳින්න.**

1)






(i)





(ii)




(iii)

2)






(i)



(ii)



(iii)

- **දී ඇති ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න**


3)

(i) මකුළුවා කෘමියෙකි. ඌට පාද අටක් ඇත.
(ii) දුම්රිය වාහනයකි. එයින් විශාල පිරිසකට එකවැර ගමන් කළ හැක.
(iii) කිඹුලා උභයජීවියෙකි. ඌ මාංශ භක්ෂක ය.

4)

(i) ජලභීතිකාව අපිරිසිදු ජලය පානය කිරීමෙන් සෑදේ.
(ii) කිණිහිර කම්මල් කර්මාන්තයේ භාවිතා කරන උපකරණයකි.
(iii) ගෙමැස්සා පිරිසිදු ආහාර මත පමණක් වසයි.

5) පහත රවුම් තුළ 1-20 තෙක් සංඛ්‍යා ලියූවිට පාටකළ කොටස තුළ ලිවිය යුතු සංඛ්‍යා වන්නේ.




(i) 5, 15, 18
(ii) 6, 12, 18
(iii) 3, 6, 18

6) A - වර වර ළඟට කැන්දා.
B - අසන නිරිඳෝ වෙන කොයින්දා.
C - මා වැනි බිළින්දා.
D - දුක් සැප කුමන්දා.

ඉහත කවිය නිවැරදි අනුපිළිවෙළට සැකසූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(i) A, B, C, D (ii) D, B, A, C (iii) C, A, D, B

7) සත්තු වත්තක සිටි න සතුන් පිළිබඳව තොරතුරු පහත සටහනේ දැක්වේ.




මෙහි පක්ෂීන් හා ගිරවු පෙන්නුම් කරන්නේ කුමන අක්ෂර වලින් ද ?

(i) Q, R (ii) P, S (iii) Q, S

- **8, 9, 10 ප්‍රශ්නවල හිස්තැනට සුදුසු සංඛ්‍යාව තෝරා යටින් ඉරක් අඳින්න.**

8)




(i) 8 (ii) 4 (iii) 6

9)

20	23	26
17	14	.....
2	5	8


(i) 11 (ii) 12 (iii) 13

10)



(i) 4 (ii) 7 (iii) 5

11) පහත මුල් රූපය දෙවන රූපය ලෙස කුඩා සමචතුරස්‍ර වලට වෙන්කර ගැනීමට නැමිය යුතු වාර ගණන කීයද ?



(i) 4
(ii) 8
(iii) 6


12) නමා ගත් රූපයේ දැකිය හැකි සමචතුරස්‍ර ගණන වන්නේ.

(i) 32 (ii) 16 (iii) 30

13) අමල්ගේ පියාගේ වයස අමල්ගේ වයස මෙන් 4 ගුණයට වඩා 4ක් අඩු ය. අමල්ගේ වයස අවුරුදු 11ක් නම් පියාගේ වයස වන්නේ,

(i) අවුරුදු 24 (ii) අවුරුදු 40 (iii) අවුරුදු 44

14) මෙහි ඇති 3 ගුණාකාරවල එකතුව වන්නේ,



(i) 30
(ii) 41
(iii) 71

15) A = 3, B = 4, C = 6, D = 2, E = 8 ලෙස යොදාගෙන හිස් තැනට සුදුසු පිළිතුර තෝරන්න

```
    A  C  D
+   B  C  D
-----------
-----------
```

(i) A D D
(ii) E D B
(iii)C A B

- **ගොවිපලක ඇති කරන සතුන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

වැඩියි ← අඩුයි	ගවයන් ← බැටළුවන්
අඩුයි → වැඩියි	ගවයන් → තාරාවන්

16) මෙහි වැඩියෙන්ම ඇතිකරන සතුන් වන්නේ.

(i) ගවයන් (ii) බැටළුවන් (iii) තාරාවන්

17) බැටළුවන් ගණන 150 ක් නම් ගවයන් ගණන විය හැක්කේ,

(i) 100 (ii) 200 (iii) 150

18) තාරාවන් ගණන විය හැක්කේ

(i) 300 (ii) 100 (iii) 200

- පහත දැක්වෙන්නේ කාලසටහනකි.

ප්‍රශ්න පත්‍රය	ආරම්භ වේලාව	අවසන් වේලාව	කාලය
02	පෙ.ව 9.30		පැය 1 මි 15
01		මධ්‍යාහ්න 12.00	පැය 1

19) 2 වන පත්‍රය අවසන් වේලාව වන්නේ

(i) පෙ.ව 10.30 (ii)පෙ.ව 10.45 (iii) පෙ.ව 10.15

20) 2 වන පත්‍රය අවසන් වී මිනිත්තු 15 ක විවේක කාලයක් ඇත්නම් 1 පත්‍රය ආරම්භ වන්නේ කීයට ද ?

(i) පෙ.ව 10.45 (ii) පෙ.ව 10.30 (iii) පෙ.ව 11.00

- **දී ඇති මුල් වචන පේළියේ සම්බන්ධය හඳුනාගෙන නිවැරදි සම්බන්ධය ඇති පේළිය තෝරන්න.**

21) සිමෙන්ති : වැලි : බ්ලොක්ගල්

(i) කිරි : දී කිරි : වෙඩරු
(ii) පාන් : බනිස් : පිටි
(iii)කොහු : ලණු : පාපිස්ස

22) වචන : වැකි : ඡේද

(i) පැස්ටල් : කඩදාසි : ප්‍රදර්ශන

(ii) නූල් : රෙදි : ඇඳුම්

(iii)වී : කුරහන් : ධාන්‍ය

- **අනුපිළිවෙළ නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.**

23)

(i) පුර අටවක, අමාවක, අව අටවක, පසළොස්වක

(ii) අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක

(iii) අමාවක, පසළොස්වක, අව අටවක, පුර අටවක


24)

(i) වී, හාල්, පිටි, ඉඳිආප්ප


(ii) බනිස්, පාන්, රොටී, තිරිඟු

(iii) සෙන්ටිමීටර, කිලෝග්‍රෑම්, මිලි ලීටර,


25) කණ්නාඩියක් ඉදිරියේ තබා බැලූ විට පිහිටි ආකාරය නොවෙනස් ව පෙනෙන රූපය තෝරන්න.



(i)



(ii)



(iii)

26) දින 366 ක් ඇති වර්ෂයක ජනවාරි 01 දා සිකුරාදා නම්, ඊළඟ වර්ෂයේ ජනවාරි 01 දා වන්නේ,

(i) සිකුරාදා (ii)සෙනසුරාදා (iii) ඉරිදා

27) සත්‍ය නොවන ප්‍රකාශය තෝරන්න.

(i) පෘථිවිය වටා සූර්යයා ගමන් කරයි.

(ii) සාමාන්‍ය අවුරුද්දකට දින 365 ක් ඇත.

(iii)සතියකට ඇත්තේ දින 7 කි.

28) 200 යේ ½ න් 50 ක් අඩුකොට ලැබෙන පිළිතුර 4 න් ගුණ කළ විට ලැබෙන පිළිතුර කුමක් ද ?

(i) 50 (ii)200 (iii) 150

29) ළමුන් හතරදෙනෙකුගේ බර පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

මාලාට වඩා අමාලි බරින් වැඩිය. රමනි නිමාලි තරම් බර නැත. මාලාගේ බර නිමාලිගේ බර මෙන් දෙගුණයකි. මෙහි බරින් වැඩිම සහ අඩුම දෙදෙනා පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න

(i) රමනි, අමාලි (ii)මාලා, නිමාලි (iii) අමාලි, රමනි


30) දෙපස ම සමාන වන පේළිය තෝරන්න.

(i) A C F D B E = F B D E F A C

(ii) ප හ ත ර ල ව = ප හ ත ර ල ව

(iii) e f u b d n = e n f u b d

31) කඩදාසි පටියක් හරිමැදින් දෙකට නවා තිත් ඉරි දිගේ කැපූ විට ලැබෙන ත්‍රිකෝණ ගණන වන්නේ,





(i) 2

(ii) 1

(iii)3

32) දී ඇති ඝන වස්තුව කඩ ඉරි දිගේ කපා වෙන් කළ විට එම කැපුම් මුහුණතේ හැඩය වන්නේ,



(i) 

(ii) 

(iii) 

33) පස්වරු **4** ට පමණ කුඹුරට යමින් සිටි ගොවි මහතාගේ සෙවණැල්ල ඔහුගේ වම් අත පැත්තට තිබුණි නම් ඔහු ගමන් කළේ කුමන දිශාවට ද ?

(i) උතුර (ii) දකුණ (iii) නැගෙනහිර


34) අවුරුදු උත්සවයක් සෑම වසර **3** කට වරක් පැවැත්වේ. **2010** වසරේ එය පැවැත්වූයේ පළමු වරට නම් **10** වන වරට පවත්වන්නේ කුමන වර්ෂයේ ද ?

(i) 2040 (ii) 2034 (iii) 2037

35) කොළඹ බලා යන බස් රථයක් මිනිත්තු **30** කට වරක් ද, ගාල්ල බලා යන බස් රථයක් මිනිත්තු **60** කට වරක් ද, මහනුවර බස් නැවතුමෙන් පිටත්වේ. බස් රථ දෙකම පෙ.ව **6.00** ට පිටත් වූයේ නම් නැවත එකවර පිටත්වන වේලාව වන්නේ,

(i) පෙ.ව 6.30 (ii) පෙ.ව 7.30 (iii) පෙ.ව 7.00

36) රූපයේ ඇති මුළු ත්‍රිකෝණ ගණන කීයද ?



(i) 4
(ii) 10
(iii) 8

37) 250 × 4, 950 + 50 ට වඩා,

(i) 50 කින් අඩුය (ii) 50 කින් වැඩිය (iii) සමානය


38) ඕනෑම සංඛ්‍යාවක් '0' න් ගුණකළ විට පිළිතුර

(i) සංඛ්‍යාවට වඩා දෙගුණයක් වැඩිය.
(ii) බින්දුව වේ.
(iii) එම සංඛ්‍යාවම ලැබේ.

39) වෙලාව පස්වරු 2.30 යි. එතැන් සිට ඔරලෝසු මුහුණතේ මිනිත්තු කටුව සම්පූර්ණ වට 2 ක් ගිය විට වේලාව කීයද ?

(i) පස්වරු 3.30 (ii) පස්වරු 4.00 (iii) පස්වරු 4.30

40) පහත ගණක රාමුවේ ගණක 15 ක් යොදාගෙන නිරූපණය කළ හැකි විශාලම සංඛ්‍යාව කීයද ?



(i) 8700
(ii) 9510
(iii) 9600

ශිල්ප යාත්‍රා

කටුගස්තොට අධ්‍යාපන කලාපය

5 ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

ii පත්‍රය

අංක 1

කාලය. පැය 1යි මිනිත්තු15යි

සැකසුම: මප/ කටු/ කොණ්ඩදෙණිය කනිෂ්ඨ විද්‍යාලය

නම.....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:

- ඔබේ නම ඉහත දැක්වෙන **තිත් ඉරි මත** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60**ක් ඇත. සමහර ප්‍රශ්න වල අනු කොටස් ද ඇත.
- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
- පිළිතුර යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා ගෙන ඊට යටින් ඉරක් අඳින්න.**

පිටු අංක	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීමකළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය.	V/II/S/CH

1) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට ඡේදය ඇසුරෙන් ම පිළිතුරු සපයන්න.

වනය ඉතා අලංකාර ය. සෑම තැනක ම ඇති ගස්වැල් සහ ඒවායේ හට ගන්නා මල් සහ ගෙඩි එහි අලංකාර බව තවත් වැඩි කරයි. ගස්වැල් බහුල නිසා දවල් කාලයේ ද වනය අඳුරු ස්වභාවයක් උසුලයි. බැලූ බැල්මට ඒ අන්ධකාරය බියකරු ලෙස පෙනුන ද වනය බෙහෙවින් සුන්දරය.

1. ඡේදයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳව ද?
.....

2. තුරුලතා යන්නට සමාන පදයක් ඡේදයෙන් සොයා ලියන්න.
.....

3. ගස්වැල් සහ ඒවායේ හටගන්නා මල් සහ ගෙඩි මගින් තවත් අලංකාර වී ඇත්තේ කොහේ ද?
.....

4. මහප්‍රාණ ආරෝහණ අක්ෂරයක් යෙදී ඇති වචනයක් ලියන්න.
.....

5. කෙටි ඇද පාපිල්ල යෙදී ඇති වචනයක් ලියන්න.
.....

6. ඡේදයේ ඇති සඤ්ඤක අකුරක් ලියන්න.
.....

(ලකුණු 6)

2) ඉරි ඇඳි පදවලට සමාන පද යොදා වාක්‍ය නැවත ලියන්න.

i. එම <u>ප්‍රවෘත්තිය</u> අසා තාත්තා පුදුමයට පත් වුණේ ය.

.....

ii. කමල්ගේ නිවසට යන <u>පාර</u> වැටී ඇත්තේ කැලෑව මැදිනි.

.....

(ලකුණු 2)

3) සුදුසු විරාම ලකුණු යොදන්න.

i. හතර ඒ ශ්‍රේණියේ ඉන්නේ මේ පුතාලා නේද

.....

ii. මැදැගිල්ල තමයි ලොක්කා නංගී උත්තර දුන්නා

.....

(ලකුණු 2)

4) පහත දී ඇති පද ගලපා අර්ථවත් වාක්‍ය සකසන්න.

i. ඒ / බින්දු / බැලුවා / විදිහට / කරලා

.....

ii. යුතුකම / පරම / මිනිසාට / සේවය / මිනිසාගේ / කිරීම / යි

.....

(ලකුණු 2)

5) පහත දී ඇති වාක්‍ය ලිඛිත භාෂාවට හරවා ලියන්න.

i. පෘතුගීසීන්ට වඩා ලන්දේසීන්ගෙන් කරදර වුණා.

.....

ii. රාජපුරුෂයෝ අල්ලපු ගෙදර මිනිසා අල්ලාගෙන ආවා.

.....

(ලකුණු 2)

6) නිවැරදි ව පද බෙදා ලියන්න.

i. අපිසිහිනලෝකවලසැරිසරමු.

.....

7) පහත තේරවිල්ලේ පිළිතුර ලියන්න.

i. ගජනාලය

.....

8) ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

i. පාරේ ..... තදබදය වැඩිවෙමින් පවතී.
ii. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ ..... වගෙයි.
iii. බස් රථය පෙරළීමට ගොස් ..... බේරිණි.
iv. ළමයින්ට සුදුසු ..... පොත්පත් තෝරාගැනීමට දෙමාපියන් උදව් කළ යුතුය.

(අනුනවයෙන්, යාන වාහන, නුසුදුසු, නඩු තීන්දුව)

(ලකුණු 6)

9) 'ඒ' ශබ්දය සඳහා යෙදෙන පිල්ලම කුමක් ද ?

.....

10) <u>පෙරා</u>ණික. මෙහි ඉරි ඇදි අකුරට යෙදී ඇති පිල්ලම් මොනවා ද ?

.....

11) පහත දී ඇති පදවල විරුද්ධාර්ථ පද ලියන්න.

1. කැමති - .....
2. ප්‍රශ්න - .....

(ලකුණු 4)

12) පහත දී ඇති ඉංග්‍රීසි වචනවල සිංහල අර්ථය ලියන්න.

1. Flower – .....
2. Spoon - .....

13) පහත දී ඇති සිංහල වචනයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරු යොදා ලියන්න.

1. ගවුම - .....
2. පැන්සල - ..... (ලකුණු 4)

14) පහත දී ඇති වාක්‍ය සඳහා යෙදෙන දෙමළ යෙදුම සිංහල අකුරු යොදා ලියන්න.

1. ඔබේ නම කුමක් ද ? -
   .....
2. වේලාව කීයද ? -
   .....

15) දෙමළ වචනවල සිංහල අර්ථය ලියන්න.

1. කෛ - .....
2. පාඩුංගල් - ..... (ලකුණු 4)

16) " මා පාසල් ගිය මුල්ම දවස මට තාම මතකයි " යන මාතෘකාවට උක්ත අඛ්‍යාත සම්බන්ධය ගැළපෙන ලෙස යොදා නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන පහකට නොඅඩු වාක්‍ය තුනක් ලියන්න.

1.....

.....

2.....

.....

3.....

.....

(ලකුණු 2 x 3 = 6)

17) දහය ස්ථානය 0, එකස්ථානය 6, සියයස්ථානය 3 වන ලෙස පිහිටි සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

.....

18) 5248 ඉරි ඇඳි ඉලක්කමෙන් නිරූපිත සංඛ්‍යාව කුමක් ද ?

.....

19) විකිණීමට ගෙනා බිත්තර තොගයක රතු බිත්තර 358 ක් ද සුදු බිත්තර 575 ක් ද තිබුණි. බිත්තර තොගයේ තිබූ මුළු බිත්තර ගණන කීයද ?

.....

20) පහත සංඛ්‍යා රටාවේ ඊළඟට ආයුතු සංඛ්‍යා දෙක ලියන්න.

81, 77, 73, 69, ..., ...

21) කර්මාන්ත ශාලාවක පිරිමි ඇඳුම් 1214 ක් ද ගැහැනු ඇඳුම් 2516 ක් ද සතියකදී නිපදවයි. නිපදවූ පිරිමි සහ ගැහැනු ඇඳුම් ප්‍රමාණය අතර වෙනස කොපමණ ද ?

.....

22) එක් පවුලකට පොල් පැළ 4 බැගින් පවුල් 230 ක් සඳහා බෙදා දීමට අවශ්‍ය පොල් පැළ සංඛ්‍යාව කීයද ?

.....

23) පාසල් **5** ක් අතර බෙදා දීමට කතන්දර පොත් **505** ක් ගෙනෙන ලදී. එක් පාසලකට ලැබෙන පොත් ගණන කීයද ?

.....

24) **9l 100ml** මිලි ලීටර් වලින් ලියන්න

.....

25) **25kg 500g** තිබූ හාල් මල්ලකින් **8kg** විකුණන ලදී. දැන් මල්ලේ තිබෙන හාල් ප්‍රමාණය කොපණ ද?

.....

26) නැගෙනහිර දිශාවට විරුද්ධ දිශාව කුමක් ද ?


.....

27) පහත ඔරලෝසු මුහුණතේ සඳහන් වේලාව සඳහන් කරන්න.



.....

28) පහත පෝච්චියේ ඇති මල් සංඛ්‍යාව රෝම සංඛ්‍යාවෙන් ලියන්න.



.....

29) නංගී කඩයට ගොස් රු.**75.00** වටිනා පාට පෙට්ටියක් ද රු.**120.00** බැගින් පොත් **2** ක් ද මිල දී ගත්තා ය. ඇය වෙළෙන්දාට ගෙවිය යුතු මුදල කීයද ?

.....

30) මෙම රූපසටහනේ ඇඳිය හැකි සමමිතික රේඛා ගණන කීයද ?



.....

31) අධික අවුරුද්දකට දින කීයක් තිබේ ද ?

.....

(ලකුණු 2 x 15 = 30)

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න**

32) සූර්ය නමස්කාර ක්‍රියාකාරකම් හා සම්බන්ධ වැරදි ප්‍රකාශයක් වන්නේ මින් කුමක් ද ?

1. මානසික යෝග්‍යතාව ඇති කරන ක්‍රියාකාරකමකි.
2. කාලය අපතේ යන ක්‍රියාකාරකමකි.
3. ශාරීරික යෝග්‍යතාව ඇති කරන ක්‍රියාකාරකමකි.

33) සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ 3 වන පියවර වන්නේ,

1. උදානය. 2. මානසික ලිහිල් බව. 3. අධිෂ්ඨානය.

34) රාජ්‍ය ලාංඡනයේ ඉර හා හඳ මගින් මූර්තිමත් වන්නේ,

1. රට හා විනයගරුක ජනයා.
2. සදාතන පැවැත්ම.
3. ජාතීන් අතර එකමුතු බව.

35) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදු කරන ක්‍රියාවක් නොවන්නේ,

1. වාහනවල ආදායම් බලපත්‍ර ලබා දීම.
2. උප්පැන්න සහතිකයක පිටපතක් ලබා දීම.
3. ඡන්ද හිමි නාමලේඛන නිකුත් කිරීම.

36) දිමියන් ගොටු සාදන්නේ ශාකවල කුමන කොටස්වලද ?

1. කඳෙහි බෙනවල. 2. පත්‍රවල. 3. මුල්වල.

37) පහත ශාක අතරින් ආහාර රසවත් කිරීමට පොතු යොදා ගන්නේ,

1. රම්පේ. 2. කරපිංචා. 3. කුරුඳු.

38) සතුන්ගේ පැවැත්මට හානිකර ආකාරයේ මිනිස් ක්‍රියාකාරකමක් නොවන්නේ,

1. කැලෑ එළි කිරීම.
2. උණුවතුර බිමට හැලීම.
3. ආහාර ලබා දීම.

39) මිනිසාට සතුන්ගෙන් සිදුවන සේවයකි

1. වගාවන්ට හානි කිරීම.
2. ආහාර ලබා දීම.
3. ගෙවල් කඩා දැමීම.

40) " ගිරෙන් ගිරට පැන ලැගුම් සොයා පුබුදමින් අරුණ කල මා ". මෙයින් කියවෙන්නේ,

1. පැල් කවියකි. 2. වන්නමකි. 3. තේරවිලි කවියකි.

41) පනාවක් පොදුවේ පරිහරණය නොකළ යුතුය. එසේ කියන්නේ,

1. පනාවක් එතරම් මිලක් නොවන නිසා.
2. රෝග බෝවන නිසා.
3. සෑම වෙළඳ සැලකින්ම ගත හැකි නිසා.

42) නිශ්පාදිත දිනය හා කල් ඉකුත්වීමේ දිනය අතර වැඩිම කාලයක් ඇත්තේ පහත ආහාර අතරින් කුමක ද ?

1. යෝගට්. 2. මුදවපු කිරි. 3. නූඩ්ල්ස්

43) පෝෂ්‍යදායි ආහාර වේලක් ලබා ගැනීමේ වාසියක් නොවන්නේ,

1. තරබාරු ශරීරයක් ලැබීම.
2. ශරීර ශක්තිය වර්ධනය වීම.
3. ලෙඩ රෝග වලින් ආරක්ෂා වීම.

44) රණවරා මල් වියළා ගැනීම සම්බන්ධව වඩා නිවැරදි ප්‍රකාශය

1. රසවත් ව්‍යාංජනයක් සකසා ගත හැක.
2. මෝස්තර නිර්මාණයට යොදා ගත හැක.
3. ඖෂධීය පානයක් සකසා ගත හැක.

45) බත් පිසීමේදී එය සුවඳවත් වීමටත් එහි විෂ ඉවත්කර ගැනීමටත් යොදාගනු ලබන ශාක පත්‍රයකි

1. කරපිංචා. 2. කුරුඳු. 3. රම්පේ.

46) වැරදි මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදුවන ආපදාවක් නොවේ.

1. නායයාම්. 2. සුනාමි 3. ගංවතුර

47) රෝග වාහක මදුරුවන් මගින් සෑදෙන රෝගයකි.

1. කොලරාව. 2. සරම්ප. 3. මැලේරියාව.

48) තෙල් අධික ආහාර ගැනීමෙන්

1. හෘද රෝග ඇති වේ.
2. සම පැහැපත් වේ.
3. හොඳින් ඇස් පෙනීම ඇති වේ.

49) ජලය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශයක් නොවන්නේ,

1. ජලයට නිශ්චිත හැඩයක් නැත.
2. ජලයට සුවඳක් හෝ වර්ණයක් නැත.
3. පිරිසිදු ජලය සුදු පාටය.

50) හෙපටයිටිස් රෝගය හඳුන්වනු ලබන තවත් නමක් වන්නේ,

1. කොලරාව. 2. අක්මා ප්‍රදාහය. 3. සෙංගමාලය.

51) ආලෝක සංඥා පුවරුවක ඉහළින් ම දක්නට ලැබෙන වර්ණය වන්නේ,

1. කහ. 2. කොළ. 3. රතු.

52) ගමනාගමනය සම්බන්ධ අවවාද දැක්වෙන ගීයකි.

1. බැරිබර කරේ තියන් දෙපයට වාරු අරන්.
2. උදෑසනම පොඩි අපි දිව එනවා.
3. පාන්දරින් ඉස්කෝලෙට ටැංටු කරත්තෙන්.

53) වගාවන් සඳහා කාබනික පොහොර භාවිතය නිසා සිදු නොවන්නකි.

1. විෂ රහිත ආහාර ලැබීම.
2. වියදම් අඩු වීම.
3. ඵල දැරීමට අධික කාලයක් ගතවීම.

54) පහත ද්‍රව්‍ය අතුරින් සුළං ටකයක් සාදා ගැනීමට අවශ්‍ය වන දෙයකි

1. මැටි මුට්ටියක්.
2. සෙ.මී 15 පමණ උස බඳ මහත කට කුඩා බෝතලයක්.
3. මීටර 2 ක් පමණ දිග ලී පටි 2 ක්.

55) පාපැදියක පැඩලය කරකැවීමේ දී වැඩි වට ගණනක් කැරකෙන්නේ,

1. විශාල දැති රෝදය. 2. කුඩා දැති රෝදය. 3. දෙකම.

56) " රන් දෑකැති ගෙන නිති සැරසෙනවා " මෙය,

1. පැල් කවියකි.
2. කමත් කවියකි.
3. ගොයම් කවියකි.

57) සහනශීලී අදහස් ප්‍රකාශය මගින් සිදු නොවන දෙයකි.

1. ගැටුම් ඇතිවීම.
2. හොඳ හිත පවත්වා ගැනීම.
3. අන් අයගේ ගරුත්වය ආරක්ෂා වීම.

58) සිදුරු කැමරාවක් මගින් ලබාගත හැකිවන්නේ.

1. උඩුකුරු ප්‍රතිබිම්බ.
2. යටිකුරු ප්‍රතිබිම්බ.
3. හරස් ප්‍රතිබිම්බ.

59) " අහසින් වැටෙන එක ජල බිඳුවක් හෝ අපතේ නොයවා ප්‍රයෝජනයට ගත යුතු යි " යනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ.

1. මොණරවිල කැප්පෙටිපොළ දිසාව.
2. දුටුගැමුණු රජතුමා.
3. මහා පරාක්‍රමබාහු රජතුමා.

60) උතුරු මැද පළාතට අයිති දිස්ත්‍රික්ක වන්නේ,

1. වවුනියාව, පොළොන්නරුව
2. අම්පාර, අනුරාධපුරය
3. අනුරාධපුරය, පොළොන්නරුව

61) බසවක්කුලම වැව හඳුන්වන තවත් නමක් වන්නේ,

1. සොරබොර වැව.
2. තිසා වැව.
3. අභය වැව.

(ලකුණු 1 x 30 = 30)

(පිරිසිදු බව හා නිවැරදි අත් අකුරු සඳහා ලකුණු 2 ක් ලබා දෙන්න)